විශ්‍රාම වැටුප් චක්‍රලේඛ: 05/2022

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2022
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2022.09.14

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

<u>විශ්‍රාම යාමෙන් පසු විවිධ හේතුන් මත විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම (PD 06)</u>

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2016 හි අංක 06 හා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2016(1) හි අංක 03 සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවමි.

02. එමගින් හඳුන්වා දී තිබූ රජයේ නිලධාරියෙකුට විශ්‍රාම වැටුප හිමිගැන්වීමෙන් පසුව ඔහුගේ විශ්‍රාම වැටුපට සිදු කරන සංශෝධනයක් සම්බන්ධයෙන් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන පහත සඳහන් හේතු අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය කළ යුතු විශ්‍රාමිකයින්ට පමණක් අදාළ වේ.

i. විශ්‍රාම යාමෙන් පසුව උසස්වීම් ලැබීම
ii. උපයාගත් වැටුප් වර්ධක අගය එකතු කිරීම
iii. දේශපාලන පලිගැනීම් යටතේ සංශෝධන
iv. විනය නියෝග අවලංගු වීම
v. නැවත සේවයට පැමිණීම
vi. වැටුප පිහිටුවීමේ දෝෂ නිවැරදි කිරීම
vii. පොලිස් වන්දි වැටුප් ලබන අයගේ විශ්‍රාම වැටුප් අවුරුදු 55 දී ප්‍රතිශෝධනය කිරීම

04. නව ක්‍රමවේදය අනුව ඉහත 03 ඡේදයේ සඳහන් හේතුන් මත විශ්‍රාම වැටුප් සංශෝධනය කළ යුතු විශ්‍රාමිකයින්ගේ අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතිය භාවිත කරන ආකාරය පිළිබඳ උපදෙස් ඇමුණුම 01 යටතේ දක්වා ඇත. තොරතුරු තාක්ෂණ පද්ධතියට තොරතුරු ඇතුළත් කර ලබාගන්නා මුද්‍රිත අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අදාළ ඇමුණුම් ලේඛන ද සමග තොරතුරු තාක්ෂණ පද්ධතිය හරහාම මාර්ගගතව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

05. අනුමත අයදුම්පත්‍ර සඳහා විශ්‍රාම වැටුප් සංශෝධනය කර ගෙවීම් ආරම්භ කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර හිඟ ගෙවීම් සිදු කිරීම තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහාම සිදු කරනු ඇත.

06. අනුමත අයදුම්පතට අදාළ සංශෝධිත ප්‍රදාන පත්‍රය, තොරතුරු තාක්ෂණ පද්ධතිය හරහා මුද්‍රණය කර ගැනීමට ආයතනට හැකියාව පවතින අතර අදාළ සංශෝධිත ප්‍රදාන පත්‍රය මුද්‍රණය කොට විශ්‍රාම වැටුප් ගෙවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යැවීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

07. 2006.01.01 ට පෙර විශ්‍රාම ගිය නමුත් ඉහත 03 ඡේදයේ සඳහන් හේතුන් මත විශ්‍රාම වැටුප් සංශෝධනයන් කළ යුතු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනයන් සම්බන්ධයෙන් මාගේ අංක 2016.06.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2016 සංශෝධන (1) යටතේ වන උපදෙස් තවදුරටත් ක්‍රියාත්මක කළ යුතුය.

08. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2022.09.15 දින සිට ක්‍රියාත්මක වේ.

ජී.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
3. විගණකාධිපති - කාරුණික දැන ගැනීම සඳහා

මෙම පද්ධතිය විශ්‍රාම වැටුප් සංශෝධන මාර්ගගත පද්ධතිය භාවිතයෙන් යොමු කිරීම සඳහා භාවිතා වේ.

පද්ධතිය සඳහා පිවිසුම

1 පද්ධතිය අභ්‍යන්තරයට පිවිසීම:

දැනටමත් ඔබට විෂය භාර නිලධාරියකු ලෙස විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතියට පිවිසීමට සක්‍රිය ගිණුමක් පවතී නම්, එම user name සහ password භාවිතයෙන්ම මෙම පද්ධතියට ඇතුළත් වීමට හැකියාව ඇත. ඔබට විෂය භාර නිලධාරියකු ලෙස දැනට භාවිතා කරන ගිණුමක් නොමැති නම් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 ට අදාළ මාර්ගෝපදේශ අත්පොත භාවිතයෙන් නව ගිණුමක් සකස් කර ගත යුතුය.

ඔබගේ පරිගණකයෙහි ඇති Google Chrome Icon ය මත click කර අන්තර්ජාලයට පිවිසෙන්න එසේ නොමැති නම් address bar එක මත www.pensions.gov.lk ලෙස ඇතුළත් කිරීම මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත පිවිසෙන්න දෙපාර්තමේන්තු වෙබ් පිටුව හි වූ PENSION MANAGEMENT SYSTEM මත Click කරන්න



1 භාවිත ගිණුම හරහා පද්ධතියේ අභ්‍යන්තරයට පිවිසීම හා දත්ත ඇතුළත් කිරීම :

PMS දත්ත පද්ධතියට පිවිසිමෙන් පසු ලැබෙන පහත අතුරු මුහුණතෙහි තුන්වන Tile එක මත Click කරන්න.



01. User name සහ password ඇතුළත් කර Login බටනය මත click කරන්න.



02. එලෙස ගිණුමට පිවිසෙන විට ඔබ විසින් ගිණුම සකස් කිරීමේදී ලබා දුන් දුරකථන අංකයට රහස් කේතයක් ලැබෙන අතර එම කේතය ඇතුළත් කර Confirm බටනය click කරන්න. ඉන් පසු ලැබෙන අතුරු මුහුණතෙහි අදාළ ආයතනය නිවැරදිව තෝරන්න.





03. එවිට දත්ත ඇතුළත් කරන විෂය නිලධාරීන් හට පහත ආකාරයේ අතුරු මුහුණතක් (Interface)දිස්වේ.



Dashboard මතට පිවිසිමේදී,

Submitted Application by DO - ආයතනික විෂය භාර නිලධාරි විසින් ඇතුළත් කරන ලද අයදුම්පත්

Rejected Application by SO – විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු විෂය භාර නිලධාරි විසින් ප්‍රතික්ශේප කරන ලද අයදුම්පත් (මෙම අයදුම්පත් ආයතනික විෂය භාර නිලධාරීන් විසින් නැවත නිවැරදි කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කල යුතුය.

Approved Application by AD - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද අයදුම්පත්

04. නව අයදුම්පතක් ඇතුළත් කිරීම.

(I) නව අයදුම්පතක් ඇතුළත් කිරීමේදී විශ්‍රාමිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විශ්‍රාම වැටුප් අංකය භාවිතයෙන් අදාළ තොරතුරු (Search) කරන්න.



(II) උදාහරණයක් ලෙස විශ්‍රාම වැටුප් අංකය ඇතුළත් කර Search කල පසු පහත පරිදි තොරතුරු දිස්වන අතර ඉන්පසු view මත click කරන්න.



(III) එවිට පහත ආකාරයේ අතුරු මුහුණතක් දිස් වේ. එහි Personal Info යටතේ වන ස්වයංක්‍රියව පෙන්වන තොරතුරු නිවැරදි නම් Next බටනය මත click කරන්න.



(IV) එවිට Current Payment යටතේ ස්වයංක්‍රියව දත්ත පෙන්වන අතර එම තොරතුරු නිවැරදි නම් Next බටනය මත click කරන්න. අවශ්‍ය නම් Back බටනය click කර පෙර පිටුවට පිවිසීමට හැක.



(V) ඉන්පසු Service Info යටතේ නිවැරදි තොරතුරු ඇතුළත් කරන්න. නිවැරදිව තොරතුරු ඇතුළත් කල පසු Next බටනය click කරන්න.



(VI) Revision Info යටතේ නිවැරදිව දත්ත ඇතුළත් කිරීම ආරම්භ කරන්න.



(VII) Retired Date ඇතුළත් කිරීමේදී පහත පරිදි කැලැන්ඩරය භාවිතයෙන් දත්ත ඇතුළත් කරන්න.



(VIII) Add Pensionable Allowance යටතේ දත්ත ඇතුළත් කිරීමට ඇති විට ඒ මත click කල පසු පහත පරිදි මුහුණතක් විවෘත වන අතර තොරතුරු නිවැරදිව ඇතුළත් කිරීමෙන් පසු Add මත click කරන්න.

PMS V2

Current Pension Point: pms

sysAdmin

Dashboard

Revision

Data Entry Officer

New Application

Dashboard

Revision Application

Personal Info — 4 Revision Info — 5 Done

REVISION IN

Revision Reason

Payment Activate Date 2016-12-12

Retired Date 2016-12-12

Circular 03/2016-2016

Salary Code mn-3

Grade grade-I

Monthly Salary 30752

Add Pensionable Allowance

Allowance Type

Amount 0

Add Close

Details of the period of service	Years	Months	Days
Period of service relevant to the calculation of pension	35	1	10

No-pay leave details	Years	Months	Days
Net No-pay Leaves	0	0	0

Pensionable Allowance (Monthly)

No Pensionable Allowances Data

Add Pensionable Allowance

Non Pensionable Allowance (Monthly)

No Non Pensionable Allowances Data

Add Non Pensionable Allowance

Calculate

Details of Monthly Pension Entitlement

Reduce Percentage(%)	78	Unreduced Percentage(%)	88
Reduced Salary	23,986.56	Unreduced Salary	27,061.76

Pay Gratuity Yes

Gratuity Calculation

New gratuity 649482.24

Previous gratuity paid 603820.80

Deductions 0

Calculate

Net gratuity payment 45661.44

Revision Required No

Back Next

Copyright © 2021-2022 Department of Pensions, Sri Lanka. All rights reserved.

Version : 2.2.10

(IX) Add Non Pensionable Allowance යටතේ දත්ත ඇතුළත් කිරීමට ඇති විට ඒ මත click කල පසු පහත පරිදි මුහුණතක් විවෘත වන අතර තොරතුරු නිවැරදිව ඇතුළත් කිරීමෙන් පසු Add මත click කරන්න.

සැයු - මේ යටතේ ඇතුළත් කල යුත්තේ විශ්‍රාම වැටුපට ඇතුළත් වන අනෙකුත් දීමනා තොරතුරු පමණි.



(X) ඉහත උපදෙස් පරිදි දත්ත නිවැරදිව ඇතුළත් කල පසු Calculate මත click කරන්න.

- Pay Gratuity යටතේ yes තෝරා ගත් විට දත්ත ඇතුළත් කිරීමට මුහුණක් විවෘත වන අතර එය නිවැරදිව සම්පූර්ණ කිරීමෙන් පසු calculate මත click කරන්න.
- Revision required යටතේ yes තෝරා ගත් විට දත්ත ඇතුළත් කිරීමට මුහුණක් විවෘත වන අතර එය නිවැරදිව සම්පූර්ණ කිරීමෙන් පසු calculate මත click කරන්න. ඉන්පසු Next බටනය click කරන්න.

PMS V2

Current Pension Point: pms

sysAdmin

Dashboard

Revision

Data Entry Officer

New Application

Dashboard

Revision Application

Personal Info | Current Payment | Service Info | 4 Revision Info | 5 Done

REVISION INFORMATION

Revision Reason	Promotion
Payment Activate Date	2016-12-12
Retired Date	2016-12-12
Circular	03/2016-2016
Salary Code	mn-3
Grade	grade-I
Monthly Salary	30752

Details of the period of service	Years	Months	Days
Period of service relevant to the calculation of pension	35	1	10

No-pay leave details	Years	Months	Days
Net No-pay Leaves	0	0	0

Pensionable Allowance (Monthly)

No Pensionable Allowances Data

Add Pensionable Allowance

Non Pensionable Allowance (Monthly)

No Non Pensionable Allowances Data

Add Non Pensionable Allowance

Calculate

Details of Monthly Pension Entitlement

Reduce Percentage(%)	78	Unreduced Percentage(%)	88
Reduced Salary	23,986.56	Unreduced Salary	27,061.76

Pay Gratuity: Yes

Gratuity Calculation

New gratuity	649482.24
Previous gratuity paid	603820.80
Deductions	0

Calculate

Net gratuity payment	45661.44

Revision Required: Yes

Revision type	14/2019

Reduce Percentage(%)	78	Unreduced Percentage(%)	88
Reduced Salary	28,188.42	Unreduced Salary	31,802.32

Back

Next

Copyright © 2021-2022 Department of Pensions, Sri Lanka. All rights reserved.

Version : 2.2.10

(XI) දත්ත සියල්ල නිවැරදිව ඇතුළත් කිරීමෙන් පසුව Save බටනය මත click කරන්න. නැවත පෙර පිටු වලට යාමට අවශ්‍ය නම් Back බටනය මත click කරන්න.



(XII)



'Re Print Source Document' බටනය මත 'Click' කිරීමෙන් මූලාශ්‍ර ලේඛනය මුද්‍රණය කර ගත හැක.



විශ්‍රාමිකයාගේ අවශ්‍ය කරන ලිපිගොණු වල මෘදු පිටපත් පහත අතුරු මුහුණත භාවිත කර ඇතුළත් කරන්න.

PMS V2

Current Pension Point: pms

sysAdmin

Dashboard

Revision

Data Entry Officer

New Application

Dashboard

Revision Application

Personal Info — Current Payment — Service Info — Revision Info — 5 Done

Application is Successfully Saved.

Re-Print Source Document

* Allow PDF files only

NIC Copy	Choose File No file chosen	Upload
Bank Account Copy	Choose File No file chosen	Upload
History sheet	Choose File No file chosen	Upload
Source Document	Choose File No file chosen	Upload
Previous service award(old)	Choose File No file chosen	Upload
Salary conversion letter	Choose File No file chosen	Upload
No claime cirtificate	Choose File No file chosen	Upload
Revision related documents	Choose File No file chosen	Upload
Other Document	Choose File No file chosen	Upload

Copyright © 2021-2022 Department of Pensions, Sri Lanka. All rights reserved.

Version : 2.2.10